ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල - 2023

-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ සඳහා පවතින ශුද්ධ වත්කම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රතිලාභ සඳහා පවතින ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 14(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා අරමුදල විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යූහය හා අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයට පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් නියෝජනය කරන්නේද යන්න අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව අරමුදල කටයුතු කර ඇති බව,
- අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 2003 දෙසැම්බර් 31 දිනැති අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත විශ්‍රාම අරමුදල් රෙගුලාසි රීති අංක 18 | ප්‍රතිපාදනයට පටහැනිව, විශ්‍රාම වැටුප් ගෙවීම් වැඩි කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, 2013 ඔක්තෝබර් 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2018 වසරේ සිට 2023 දක්වා රු. මිලියන 866.22 ක මුදලක් වෛද්‍ය ගෙවීම් ලෙස ගෙවා තිබුණි. | 2022-06-16, 2022-02-03 සහ 2021-09-30 දිනැති අංක සීඊබී/ඒසීසීටී(පීඊඑන්)සීසී යන ලිපි මගින් ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඉල්ලා සිටින ලියකියවිලි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත වරින් වර ලබා දී ඇත. | විශ්‍රාම අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ සඳහා පවතින ශුද්ධ වත්කම් රු. මිලියන 59,766 ක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ප්‍රතිලාභ සඳහා පවතින ශුද්ධ වත්කම් රු. මිලියන 53,968 ක් විය. ඒ අනුව, ප්‍රතිලාභ සඳහා පවතින ශුද්ධ වත්කම්වල රු. මිලියන 5,798 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. 2024 පෙබරවාරි 21 වැනි දින ගෙන තිබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ආයුගණක තක්සේරු වාර්තාව හරහා හඳුනාගත් රු. මිලියන 2,003 ක හිඟය ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස හඳුනා ගැනීම මෙම වර්ධනයට හේතු වී තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුළු මුදල රු. මිලියන 28,087.37 ක් විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| ආදායම/වියදම | 2023 | 2022 | වැඩිවීම / (අඩුවීම) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආයෝජන ආදායම | 5,620 | 3,825 | 1,795 | 47 |
| විශ්‍රාමිකයින්ට ගෙවූ ප්‍රතිලාභ | 4,344 | 3,090 | 1,254 | 41 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා රු. මිලියන 400.4 ක මුදලක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබූ අතර කළමනාකරණ කමිටුවේ අනුමැතියකින් තොරව සමාගම එම ආයෝජනය ඉවත් කරගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද, 2015 වසරේ ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් කරන ලද විමර්ශනයක දී ශ්‍රී ලංකා බැංකුව වෙතින් ලද තහවුරු කිරීම් (ලංකා සෙකියො පද්ධතිය) අනුව විශ්‍රාම අරමුදල නමින් භාණ්ඩාගාර බැඳුම්කර නොතිබූ බව අනාවරණය විය. කෙසේ වෙතත්, 2018 දී කල් පිරෙන දින දක්වා වූ උපචිත කූපන් පොලිය සමඟ ආයෝජිත මුදල අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව වසර 2 කට වැඩි ප්‍රමාදයකින් පසුව සිවිල් නඩුවක් ගොනු කර තිබුණි. තවද, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිවයුතු නිලධාරීන් හඳුනා ගැනීමට නිසි ක්‍රියාමාර්ගයක් නිසි වේලාවට ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී මෙම කරුණ අනාවරණය කර ගෙන තිබූ අතර, පරිනත වීමට තිබූ ආයෝජිත මුදල අයකර ගැනීම සඳහා වහාම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත 2015-12-09 දින පැමිණිලි කර ඇත. ඉන් අනතුරුව, එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් අංක බී290/2016 දරන නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර තිබුණි. තවද, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ වාර්තාව මත පදනම්ව, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා විසින් විෂය ෂේත්‍රයක් යටතේ මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා කමිටුවක් පත් කර තිබුණි. කිසිදු සාක්ෂියක් නොමැතිවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් අක්‍රමිකතා, වංචා හෝ දූෂණ චෝදනාවලට ලක්ව නොමැති බව හඳුනා ගනිමින් කමිටුව විසින් වාර්තාව අවසන් කර තිබුණි. අංක ඩීඑම්ආර් 1029/2018 දරන නඩුව ගොනුකරමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව පියවර ගෙන ඇති අතර එය දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී. | මින් ඉදිරියට මෙවන් සිදුවීම් ඇති නොවීමට නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවට සහතික විය යුතු අතර, සිදු වූ පාඩුව අයකර ගැනීමට සියලු සාධාරණ ක්‍රියාමාර්ග ගත යුතුය. එමෙන්ම, නොසැලකිල්ල සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |